(හයවැනි පාර්ලිමේන්තුව —තෙවැනි සභාවාරය)

අංක. 2]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2008 ජුනි මස 06 වැනි සිකුරාදා පූ. භා. 9.30 ට**

## ප්‍රධාන කටයුතු ආරම්භයේදී

### පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ,— අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් දැක්වීම සහ එම අයිතිවාසිකම් සහ හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම පිණිස ද; වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමට අදාළ සුදුසු ජාත්‍යන්තර ප්‍රතිමාන සහ යහපත් ප්‍රතිපත්ති බලාත්මක කිරීම පිණිස ද; අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා ජාතික අධිකාරියක් පිහිටුවීම සහ ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක අංශය පිහිටුවීම පිණිස ද; අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

### යෝජනා පිළිබඳ දැනුම්දීම

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු (අංක 1),— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 2 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු (අංක 2),— අද දින ආණ්ඩුවේ කටයුතු මුඛ්‍යස්ථානය ගත යුතු ය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2008.06.05 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 4.30 දක්වා ද විය යුතු ය. අ.භා. 3.30 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— තේරීම් කාරක සභාව,— ස්ථාවර නියෝග 121 හි කුමක් සඳහන්ව තිබුණ ද, පවත්නා සැසිවාරයේ සේවය සඳහා වන තේරීම් කාරක සභාව, කථානායකතුමාගේ සභාපතිත්වයෙන් සහ දේශපාලන පක්ෂවල නායකයින් හෝ ඔවුන්ගේ නියෝජිතයින් වන, පාර්ලිමේන්තුව විසින් නම් කරනු ලබන සාමාජිකයින් විසිතුන් දෙනෙකුගෙන් (23) සමන්විත විය යුතු ය.

6.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව ,— 2006 අප්‍රේල් මස 04 වැනි දින ගරු කථානායකතුමා විසින් පත් කරන ලද මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවට, තමා විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු 2007 දෙසැම්බර් මස 10 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මගින් නියම කර ඇති කාල සීමාව ඇතුලත පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට නොහැකිවන බැවින් එම කාරක සභාවට ලබා දී ඇති කාල සීමාව අංක 96 දරන ස්ථාවර නියෝගය ප්‍රකාරව 2008 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා දීර්ඝ කළ යුතු ය.

7.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— ශීඝ්‍රයෙන් ඉහළ යන රථවාහන අනතුරු පිළිබඳව කරුණු විමර්ශනය කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— 2007 මාර්තු මස 09 වැනි දින ගරු කථානායකතුමා විසින් පත් කරන ලද, ශීඝ්‍රයෙන් ඉහළ යන රථවාහන අනතුරු පිළිබඳව කරුණු විමර්ශනය කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවට, තමා විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු 2007 නොවැම්බර් මස 06 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මගින් නියම කර ඇති කාල සීමාව ඇතුළත පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට නොහැකිවන බැවින් එම කාරක සභාවට ලබා දී ඇති කාල සීමාව අංක 96 දරන ස්ථාවර නියෝගය ප්‍රකාරව 2008 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා දීර්ඝ කළ යුතු ය.

8.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන ව්‍යසනයන් පරීක්ෂා කර බලා ඒවා වැළැක්වීම පිණිස ගතයුතු පියවර නිර්දේශ කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— 2006 ජූලි මස 20 වැනි දින ගරු කථානායකතුමා විසින් පත් කරන ලද මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන ව්‍යසනයන් පරීක්ෂා කර බලා ඒවා වැළැක්වීම පිණිස ගතයුතු පියවර නිර්දේශ කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවට, තමා විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු 2007 ඔක්තෝබර් මස 24 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මගින් නියම කර ඇති කාල සීමාව ඇතුළත පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට නොහැකි බැවින් එම කාරක සභාවට ලබා දී ඇති කාල සීමාව අංක 96 දරන ස්ථාවර නියෝගය ප්‍රකාරව 2008 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා දීර්ඝ කළ යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

1.

ගරු රවි කරුණානායක මහතා,— ජනාධිපතිවරයා සහ අගමැතිවරයා අමාත්‍ය ධුරයන් දැරීමෙන් වැළැක්වීම,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2007 ජූලි 06) “ඉතා ඵලදායී පරිපාලනයක් පවත්වාගෙන යාමටත්, තම ඇමතිවරුන්ගේ කටයුතු නිසි ලෙස සමාලෝචනය කිරීමටත් ජනාධිපතිවරයා හා අගමැතිවරයා කිසිදු අමාත්‍ය ධුරයක් නොදැරිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී. [පා. 3/’05]

*2.

අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියමය,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තියේ (1) වැනි හා (2) වැනි උපවගන්ති යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව, අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යතුමා විසින් සෙස් බදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 මාර්තු මස 03 වැනි දිනැති අංක 1539/1 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.05.06 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*3.

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*5.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*6.

පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*7.

සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*8.

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*9.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*10.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.) [1]

*11.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18). [1]

*12.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*13.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*14.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2008 ජනවාරි මස 09 වැනි දින 1531/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.03.04 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*16

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තියේ (උ) ඡේදය යටතේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලදුව වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද, 2008 ජනවාරි මස 10 වැනි දින අංක 1531/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.04.09 වැනි දින ඉදිරිපත් කරන ලද “ 2008 අංක 01 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ( තේ කර්මාන්ත ශාලා ඉදි කිරීම සහ ක්‍රියාත්මක කිරීම) අවම ප්‍රමිති නියෝග” අනුමත කළ යුතු ය.

*17

විදේශ කටයුතු අමාත්‍යතුමා,— කොන්සියුලර් කර්තව්‍ය පනත යටතේ නිවේදනය,— 1981 අංක 4 දරන කොන්සියුලර් කර්තව්‍ය පනතේ 8 වැනි වගන්තිය යටතේ කොන්සියුලර් සේවා සඳහා අය කරනු ලබන ගාස්තු සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2007 ජූනි මස 11 වැනි දින අංක 1501/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008. 02. 05 වැනි දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

*18.

ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ වාර්ෂික වාර්තාව 2004,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2006. 07. 21 වැනි දින ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2004 වර්ෂයේ වාර්ෂික වාර්තාව, අවසාන ගිණුම සහ විගණකාධිපතිගේ වාර්තාව අනුමත කළ යුතු ය.

(නිවාස සහ ඉදිකිරීම් පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී)

*19.

ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා,— ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව 2005,— 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය යටතේ 2006.11.24 වැනි දින ඉදිරිපත් කරන ලද ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ 2005 වර්ෂයේ වාර්ෂික වාර්තාව, අවසාන ගිණුම සහ විගණකාධිපතිගේ වාර්තාව අනුමත කළ යුතු ය.

(ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී)

*20.

වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වන වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 වැනි දින අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*21.

විශේෂ ව්‍යාපෘති අමාත්‍යතුමා සහ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වන) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යවරයා විසින් මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 වැනි දින අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතුය.

*22.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවනු ලබන මාසික දීමනාව සිය නිත්‍ය තනතුරේ මාසික වැටුපෙන් 1/3 කට සමාන මාසික දීමනාවක් විය යුතු යැයි ද, එය 2007 ජනවාරි මස 01 වැනි දින සිට ගෙවිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට, මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනාව ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*23.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ තීරණය,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2(7) ඡේදය අනුව එම කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| වැටුප | - | රු. 66,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14.400.00 | මාසික |
| | එකතුව | රු. 80,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| වැටුප | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනා | - | රු. 12,000.00 | මාසික |
| | එකතුව | රු. 77,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනාව සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ පාරිශ්‍රමිකය හා දීමනාව, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14.400.00 | මාසික |
| | එකතුව | රු. 79,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද පාරිශ්‍රමිකයෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද පාරිශ්‍රමික හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*25.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| දීමනාව | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14.400.00 | මාසික |
| | එකතුව | රු. 79,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| දීමනාව | - | රු. 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද දීමනාවෙන් (ඉන්ධන දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ දීමනාව 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*26.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

27.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

28.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

29.

මහවැලි සංස්කෘතික පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

30.

රංගා කලායතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

31.

සංස්කෘතිය සහ සංවර්ධනය සඳහා වූ මුස්ලිම් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

[1]

" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.